# ශ්‍රී ලංකාවේ බෝධිසත්ත්ව වන්දනය සහ අවලෝකිතේශ්වර බොධිසත්ත්ව ප්‍රතිමාකරණය

*අජිත් තල්වත්ත*

## ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ ප්‍රචලිත මහායාන වන්දනය තුළ බෝධිසත්ත්ව වන්දනයට හිමි වන්නේ සුවිශේෂී වැදගත් කමකි. මහායාන බුදු සමයෙහි ප්‍රධාන තැනක් ගන්නා බෝධිසත්ත්ව සංකල්පය යටතේ වඩාත් ජනප්‍රියත්වයට පත් වූයේ අවලෝකිතේශ්වර ය. උන්වහන්සේ දෙවියන් ලෙසින් බෝධිසත්ත්වවරයෙකු හැඳින්වීමට හේතු වූයේ බෝධිසත්වවරුන් ද දෙවිවරුන් මෙන් මහායානිකයන් විසින් ඇදහීම යැයි ගෙනහැර දැක්විය හැකි ය. මෙම මහායාන බෝධිසත්ත්ව සංකල්පයෙහි ජනප්‍රිය වූ අවලෝකිතේශ්වර ඇදහිල්ල තුළ ප්‍රතිමාකරණය ද විශේෂිත ය. මෙම අධ්‍යයනය මගින් අපෙක්ෂා කරන්නේ මෙරට බෝධිසත්ත්ව වන්දනයේ ව්‍යාප්තිය හඳුනාගෙන, අවලෝකිතේශ්වර ප්‍රතිමා පිළිබඳ සාකච්ඡා කිරීමට ය.

## විමර්ශනය

ක්‍රි.පූ. දෙවන ශතවර්ෂයෙහි පමණ භාරතයේ ආරම්භ වූ සේ සැලකන බෝධිසත්ත්ව සංකල්පය ඊට ආසන්න කාලයේ ම ශ්‍රී ලංකාවට ලැබෙන්නට ඇතැයි සිතිය හැකි බව මොරටුවේ සාසනරතන හිමියන්ගේ මතය වේ.[1] මෙම සංකල්පයේ ආරම්භය හා විකාශනය පිළිබඳව විමසීමේදී බෝධිසත්ත්වයින් පිළිබඳව විමසා බැලීම ඉතා වැදගත් වේ. මෙයින් අනාවරණය වන්නේ බෝධිසත්ත්වවරුන් වර්ග දෙකක් සිටින බවයි. පාලි බුදුසමයෙහි දැක්වෙන බෝධිසත්වවරුන්ට "මානුෂි බෝධිසත්ත්වවරුන්" ලෙස හඳුන්වයි.[2] මහායානයේ ඉගැන්වෙන සම්භෝගකාය හා සම්බන්ධ බෝධිසත්ත්වවරුන් "ධ්‍යානී බෝධිසත්වවරුන්" සේ හඳුනාගත හැකිය.[3] මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාසයන් විසින් දක්වන සඳහනට අනුව ථෙරවාදී මානුෂි බෝසත්වරුන් සහ මහායාන ධ්‍යානි බෝසත්වරුන් ලෙස කොටස් දෙකකට බෙදිය හැකිය.[4] ලක්දිව බෝධිසත්ත්ව සංකල්පය ආරම්භ වන්නේ මානුෂි බෝධිසත්වවරුන්ගෙන් බව පෙනේ. විපස්සි, වෙස්සභූ, කකුසඳ, කෝණාගම, ගෞතම හා මතු බුදුවන මෛත්‍රී යන බෝසත්වරු මානුෂි බෝසත්වරුන් වශයෙන් වැඳුම් පිදුම් ලබති.

එම බෝසත්වරුන් අතරින් ද ලක්දිව වඩාත් ජනප්‍රිය වූයේ මෛත්‍රී බෝසත් සංකල්පය යි.[5] මේ සඳහා බලපෑවේ බෞද්ධයන් මතු බුදුවන මෛත්‍රී බුදුන් දැක නිවන් දැකීමට කැමති වීම විය හැකි ය. සම්බුදුවරුන්ගේ අභිනිෂ්ක්‍රමණය දැක්වෙන චිත්‍රයක් කුරණ්ඩක ලෙනෙහි පැවති බව පාලි අට්ඨකථාවක දැක්වෙයි.[6] මේ අනුව ලක්දිව බෝධිසත්ත්ව සංකල්පයෙහි ආරම්භය ථෙරවාදය මූලිකව ක්‍රි.පූ. 2 වන සියවස හෝ ඊට ආසන්න කාලය ලෙස සැලකිය හැකි ය.

---

1 සාසනරතන, මොරටුවේ, **ලක්දිව මහායාන අදහස්**, (බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශන, 1952), 239 පිට.

2 **එම.**, 194-202 පිටු.

3 වික්‍රමගමගේ, චන්ද්‍රා **"ශ්‍රී ලංකාවේ බෝධිසත්ත්ව සංකල්පය," සංස්කෘති ප්‍රස්තිකා මාලා**, 4, (බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1996), 04 පිට.

4 කේ.එන්.ඕ. ධර්මදාස, සහා එච්.එම්.එස්. තුන්දෙණිය, **සිංහල දේව පුරාණය**, (පාදුක්ක: මුද්‍රණ නීතිගත සංස්ථාව, 1994), 80 පිට.

5 චන්ද්‍රා වික්‍රමගමගේ, **ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා කලාව**, (කොළඹ: එස්. ගොඩගේ සහ සමාගම, 2006), 59 පිට.

6 සයිමන් හේවාවිතාරණ, **විසුද්ධිමග්ග**, (සංස්.), (කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණය, 1920), 29 පිට.

ක්‍රි.පූ. දෙවන සියවසේ ලක්දිව බෝධිසත්ත්ව සංකල්පය පිළිබඳ අදහස් පැවති බවට සාධකයක් ලැබේ. දුටුගැමුණු රජු රුවන්වැලිසෑයේ ධාතු ගර්භයේ බෝධිසත්ත්ව චිත්‍ර ඇඳි බවත්,[7] මතු බුදුවන මෛත්‍රී බෝසතුන්ගේ දකුණු අගසව් වන බවට දුටුගැමුණු රජු පත්වන බවත්, සද්ධාතිස්ස දෙවන අගසව් වන බවත්, සාලිය රාජ කුමාරයා පුත්‍රයා වන බවත් කාවන්තිස්ස රජු සහ විහාර මහාදේවිය එම බෝසතුන්ගේ පියා හා මව වන බවත් මහාවංසයේ සඳහන් වේ.[8] මෙම අදහසින් ලැබෙන ඉඟිය වන්නේ බෝසත් සංකල්පය එකල සිට පවතින බවයි. නමුත් මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ පවසන්නේ මහායාන බලපෑම ලැබෙන තෙක් බෝධිසත්ත්ව වන්දනාව මෙහි ජනප්‍රිය අංගයක් නොවූ බවයි.[9] දුටුගැමුණු රජ පවුල මෛත්‍රිය බෝසතුන් සමඟ සම්බන්ධ කිරීමට මහාවංස කතුවරයා උත්සාහ දැරීම මගින් සනාථ වන්නේ බුදුදහම ස්ථාපිතවී කෙටි කාලයක් තුළ බෝධිසත්ත්ව සංකල්පය ද ලාංකික සමාජය තුළ ප්‍රචලිත වූ බවකි.

එහෙත් කාලානුරූප ව මහායාන බුදුදහමේ ව්‍යාප්තිය හේතුකොට ගෙන ලක්දිව ද බෝධිසත්ත්ව වන්දනය ප්‍රචලිත වූ බව පෙනේ.[10] වෛතුල්‍යවාදය තදින් ප්‍රචලිත වීමත් එයට රාජානුග්‍රහය ලැබීමත් නිසා ආමිස පූජාව ප්‍රචලිත වී ප්‍රතිමා වන්දනාවට ආගමික වශයෙන් වැදගත් තැනක් හිමි වේ.[11] වෛතුල්‍යවාදීන් මහායානිකයන්ම බවට මහාචාර්ය කර්න් දක්වන බවත් මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ අදහසයි. ඒ බව, ණිෂබ එයැ රුසටබ දෙ ඍදය්ර්න් ඔසී ඃකරසජ 263-285 ՚ගෘ* ՚ යැරුඑසජක්්ැජඑ ජ්කකැා එයැ ඩසඑමකහී ඃඡගඩඑමකක්* සබ එයැ කැහකදබ ජයරදබසජක්ිල සෙරිඑ ජ්නැ එයැසර ՚චඑැ්ර්බජැඍ ඍැකහසබට දබ එයසිල ඡරදගෙණැරබ ෂාැබඑසො එයැ්චැකළු ඩසඑමකහ්ඩාසි දෙ කැහකදබ අසඑය එයැ ඒය්හ්බසිඑ□[12]ඤවයන ප්‍රකාශයෙන් එය වඩාත් පැහැදිලි වේ.

ලක්දිව මහායානය මුල්කොට ගත් බෝධිසත්ත්ව සංකල්පය වෝහාරිකතිස්ස රාජ්‍ය සමයේ ඇරඹෙන බව පෙනේ. නමුත් මහසෙන් රාජ්‍ය සමයේදී ජේතවනාරාමය ඉදිවීමත් සමඟ එය මහායානය මූලික කරගත් මතවාද විකාශනය කිරීමෙහි මූලස්ථානය විය. මහසෙන් රජුගේ අනුග්‍රහය යටතේ විවිධ බුද්ධ ප්‍රතිමා ඉදි කළ බව මහාචාර්ය ආරියලගමුව විසින් පෙන්වාදී තිබේ.[13] ලෝහ ප්‍රතිමා දෙකක් කරවා මහබෝගෙයි බටහිර දිගින් තැන්පත් කළ බව මහාවංසයේ සඳහන් වේ.[14] තවද පළමුවන ජෙට්ඨතිස්ස රජු ප්‍රතිමා ශිල්පයෙහි දක්ෂයකි. ඔහු ඍද්ධි බලයකින් කළාක් මෙන් සුන්දර විය. මහසෙන් රජු එයට ආසනයක්, ඡත්‍රයක් සහ මණ්ඩපයක් ද අත්‍යලංකාර ව කරවූ බව පෙනේ.[15] මෙවක් පටන් සිංහල රජවරුන් බෝධිසත්වයන් කරවීම සහ පුද පූජා සිදු කළ බවට මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ පෙන්වා දෙයි.[16] තවද ධාතුසේන රජතුමා මෛත්‍රේය බෝධිසත්ත්ව ප්‍රතිමාවකට සියලු ආභරණ පැලඳවූ බවට සඳහන් වේ.[17]බෝධිසත්ත්ව වන්දනය යටතේ අවලෝකිතේශ්වර බෝසතුන්ට සහ මෛත්‍රේය බෝසතුන්ට මූලිකත්වය හිමි වන්නට ඇතැයි අනුමාන වශයෙන් අවබෝධ කරගත හැකි ය. මෙයින් ද අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පය ලක්දිව ප්‍රබල ව පැවති බව පෙනේ.

තෙවැනි ශතවර්ෂයේ අගභාගයේදී පමණ මෙරට ආරම්භ වන්නට ඇතැයි සැලකෙන බෝධිසත්ත්ව වන්දනය පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක හමුවෙනුයේ හත්වන හෝ අටවන සියවසේදී බව මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස දක්වයි.[18] බෝධිසත්ත්ව සංකල්පය මහාවිහාර සහ අභයගිරි භේදයකින් තොරව පිළිගන්නා ලදී. මේ අනුව බුද්ධ හා බෝසත් වන්දනාව සමාන තත්ත්වයට පත්වීමට තරම් ජනප්‍රිය විය.

7 **ඌන පූරණ සහිතො මහාවංසය, (සංස්.)**, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, (කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1929), 30 77-78 පිටු.

8 **එම.**, 32, 81-83 පිටු.

9 වික්‍රමගමගේ, (2006), 59 පිට.

10 අටබාගේ පියනන්ද හිමි, **ලක්දිව බුද්ධ ප්‍රතිමාවේ ලක්ෂණ**, (කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල, 1997), 39 පිට.

11 ආරිය ලගමුව, (කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල, 1999), 43 පිට.

12 S. Paranavithana, **"Mahayanism in Ceylon"** The Ceylon Journal of Sciences II, Part 1, Arehelogy, Ethnolgy, 1928), 36p.

13 ලගමුව, එම., 1999, 43 පිට.

14 **මහාවංසය**, 37 පරි., 31 ගාථා.

15 **චූලවංසය**, සංස්. විල්හෙම් ගයිගර්, (මදුරාසිය: ආසියානු අධ්‍යාපන සේවය, 1968), 37 පරි., 102-103 ගාථා.

16 වික්‍රමගමගේ, 2006, 61 පිට.

17 **චූලවංසය**, 38 පරි., 68-69 ගාථා.

18 ධර්මදාස සහ තුන්දෙනිය, 1994, 74 පිට.

මෙම අවධියේ බෝධිසත්ත්ව පිළිම රැසක් දිවයිනේ විවිධ ප්‍රදේශ ඇසුරෙන් ව්‍යාප්ත වූ බව පෙනේ.[19] මේ සඳහා නිදසුන් ලෙස දඹේගොඩ ප්‍රතිමාව, විජයාරාම ධාරණී ලිපිවල අවලෝකිතේශ්වර ප්‍රතිමා, කුෂ්ටරාජගල ප්‍රතිමාව, බුදුරුවගල ප්‍රතිමා යනාදිය දැක්විය හැකි ය.

ශ්‍රී ලංකාවේ බෞද්ධ දේශපාලන අදහස්වලට ද මහායානික බලපෑම් ගැබ් වී තිබේ. සිවුවන මහින්ද යුගයට අයත්යැ'යි සැලකෙන අභයගිරි විහාරභූමියේ තිබී සොයාගන්නා ලද අභිලේඛනයකින් මීට පැහැදිලි සාක්ෂ්‍ය ලැබේ. අවලෝකිතේශ්වර ආදී ප්‍රධාන බෝධිසත්වවරුන්ට අමතර ව ජනයාගේ ගෞරවාදරය ලබන රජවරුන් බෝසත්වරුන් සේ සැලකීම මෙම කාලයේ ඇති විය. ,ලක්දිව නොබෝසත්හු නොරජ් වන්නේයි,[20]යනුවෙන් සඳහන් වීමෙන් පාලකයා කවරෙකු විය යුතු ද යන්න මනාව සනාථ වේ. මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ රජෙකු වීමට බෞද්ධයකු පමණක් නොව බෝධිසත්ත්වයකු වීම ද අවශ්‍ය වූ බවයි. එම අභිලේඛනයෙහි උද්ගත වන අදහස නම් රජකමට පත්වන සියල්ලන් ම බෝධිසත්ත්වයකු වීම අවශ්‍ය බවයි. ගිහියකුට බෞද්ධ සමාජ පද්ධතිය තුළ ප්‍රාර්ථනා කළ හැකි උසස් ම තත්ත්වයට රජකම දැක්වීම මෙරට රාජ්‍යත්වය පිළිබඳ සංකල්පයෙහි දියුණු අවධියකි. තෙවන සියවසේ විසූ සිරිසඟබෝ රජතුමා තත්කාලීනව බෝසත්වරයකු සේ නොපිළිගැනුණ ද පසුකාලීන ව එරජු ද බෝසත් සේ සැලකූ බව පෙනේ. සිරිසඟබෝ රජතුමා බෝධිසත්ත්ව යන්නට විශේෂ පදයක් වශයෙන් මහාසත්ත්ව යන වචනයෙන් ද හැඳින්වූහ.[21] සමහර රජවරු බෝධිසත්ත්ව නාමය මාරුවෙන් මාරුවට භාවිත කළහ. බුද්ධදාස රජු (ක්‍රි.ව.337-365) බෝධිසත්ත්ව ජීවිතයක් ගත කළ අතර[22], දෙවැනි උපතිස්ස (ක්‍රි.ව.517-518) දසපාරමිතා පිරූ බව සහ පළමුවන අග්‍රබෝධි (ක්‍රි.ව.571-604) හා පළමුවන සේන (ක්‍රි.ව.833-853) රජවරුන් බුද්ධත්වය ප්‍රාර්ථනා කළ බව පෙනේ.[23]එමෙන් ම නිශ්ශංකමල්ල රජුගේ (ක්‍රි.ව.1187-1196) ගල්පොත්ත ශිලා ලිපියේ "රජ දරුවන් මනුෂ්‍ය රූපයෙන් සිටිය ද නර දෙවතා හෙයින් දෙවියන් සේ දැකිය යුතු යැ"[24].

මේ මගින් පැහැදිලි වන්නේ බෝධිසත්ත්ව සංකල්පය මුල සිට ම දේශපාලනය හා තදින් බැඳී සිටි බවකි. එකළොස්වන සියවසේ පමණ සිට මෙරට බුද්ධාගමෙහි නව නැම්මක් ඇති විය. මහා විජයබාහු රජතුමා බුරුම දේශයෙන් භික්ෂූන් වැඩමකර බුදු දහමේ උන්නතියට කටයුතු කළේය. තවද මහා පරාක්‍රමබාහු රජතුමා අභයගිරි හා ජේතවන නිකාය විසුරුවා හැර එම නිකාය දෙකේ සංඝයාගෙන් කැමති කෙනෙකුට මහා විහාරයට සම්බන්ධ වන ලෙස නියම කොට, එසේ මහා විහාරයට සම්බන්ධ වීමට අකමැති වූ අයට සිවුරු හැර රජයේ රැකියාවලට යාමට අවස්ථාව සැලැස්වීය.[25] මේ නිසා මහායාන ඇදහිලි විශ්වාස පිළිගත් පිරිසක් මහා විහාරයට එක්වූහ. ඒ සමඟ ම එතෙක් ජනප්‍රිය ව පැවති මහායාන ඇදහිලි සහ විශ්වාස මිශ්‍ර සිංහල බුද්ධාගම මෙරට ස්ථාපිත වේ.

මෙම පසුබිම තුළ එතෙක් වන්දනයට පාත්‍ර වූ බෝධිසත්ත්වයන් සේ දැක් වූ මෛත්‍රේය ආදී බෝසතුන් දේවත්වයට පත් වේ. 13 වන සියවසට අයත් රූපාවලියේ ද හින්දු දෙවිවරුන් අටදෙනෙකුගේ නම් නාථ යන්න එක්කොට එවැනි නාථයන් අට දෙනෙකු ගැන විස්තර කර තිබේ. මෙමගින් සිදු වන්නේ හින්දු දෙවිවරුන් බෝධිසත්ත්ව බවට පත් වීමයි. එනම් ශිව නාථ, බ්‍රහ්ම නාථ, විෂ්ණු නාථ, ගෞරි නාථ, මත්සෝයන්ද්‍ර නාථ, භද්‍ර නාථ, බෞද්ධ නාථ, සහ ගණ නාථ යනුවෙනි.[26] මෙමගින් පෙනී යන්නේ ඉහත දෙවිවරුන් නාථ හෙවත් අවලෝකිතේශ්වර අවතාර හෝ වේශ ලෙස ඉදිරිපත් කර ඇති බව මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ දක්වයි.[27]බෝධිසත්ත්ව සංකල්පයේ විකාශනය සමඟ අවලෝකිතේශ්වර හා මෛත්‍රී යන බෝධිසත්ත්වවරුන් සිංහල බෞද්ධ, දේශපාලන හා සමාජ සංකල්පය තුළට අන්තර් ග්‍රහණය වීමක් 14 වන සියවසේ සිට 17 සියවස දක්වා සිදු විය.

19 ගුණවර්ධන, රණවීර, **සිවුර හා නගුල**, (කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, 1997), 49 පිට.

20 **Epigraphia Zeylanica**, (ed.), Senerat Paranavitana, (London: Oxford University Press, 1948), III, 234p.

21 **මහාවංසය**, 36 පරි., 90 ගාථා.

22 එම, 37 පරි., 109 ගාථා.

23 එම, පරි., 1 ගාථා. සහ පරි., 60ගාථා.

24 **EZ.** II, 113 p.

25 **නිකාය සංග්‍රහය**, (සංස්.), සීමොන් ද සිල්වා, මෙන්ඩිස් ගුණසේකර සහ ඩබ්ලියු.එෆ්. ගුණවර්ධන, (කොළඹ: රජයේ මුද්‍රණාලය, 1907), 21-22 පිටු.

26 **මහා පිරිත් පොත**, සංස්. දෙවුන්දර වාචිස්වර, කොළඹ, 1986, 318-319, පිටු. ගාථා. 18.

27 වික්‍රමගමගේ, 2006, 65 පිට.



මේ අනුව හත්වන සියවසේ සිට ලක්දිව බෞද්ධයා අතර ගෞරව බහුමානයට පත්වූ අවලෝකිතේශ්වර බෝසතුන් අවලෝකිතේශ්වර නාථ, ලෝකේශ්වර නාථ හෝ නාථ නමින් දේවත්වයට පත්වූ බව පෙනේ. මහනුවර රාජධානියෙහි නාථ දෙවියන් මෛත්‍රී බෝධිසත්ත්වයන් හා බද්ධ ව එක දෙවි කෙනෙකු ලෙස පෙනී සිටීමක් ද දක්නට ලැබේ. මෙම අදහස බෞද්ධ ජනතාවගේ හදවත් තුළ ගොනු වී තිබේ.

මෙරට නිර්මාණය වූ බෝධිසත්ත්ව ප්‍රතිමා අතර අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමාවට හිමි වන්නේ සුවිශේෂී වැදගත්කමකි. එමගින් උන්වහන්සේට හිමිවූ ස්ථානය අවබෝධ කරගත හැකි ය. මෙම බෝධිසත්වයන් පිළිබඳව මුල් ම අභිලේඛනමය සාක්ෂිය වන්නේ ක්‍රි.ව.7 හෝ 8 වැනි සියවසේ මුල් කාලයට අයත් තිරියායෙන් හමුවූ සෙල්ලිපියයි.[28] හතරවැනි මිහිඳු රජුගේ මිහින්තලා සෙල් ලිපියේ සඳහන් "නයින්ද මිණිනාල් දෙවි මැඳුර"[29] යන වාක්‍යයේ නයින්ද යන්න නාථේන්ද්‍ර යන සංස්කෘත වචනයෙන් බිඳුණක් බව ද එයින් අවලෝකිතේශ්වර දෙවි මැඳුරක් ගැන සඳහන් වන බව ද මහාචාර්ය සෙනරත් පරණවිතාන පවස යි.[30] ක්‍රි.ව. 9 වැනි හෝ 10 වැනි සියවසට පමණ අයත් අනුරාධපුර විජයාරාමයෙන් හමු වූ ඵලකය මහා කාරුණික යන විරුදාවලියෙන් හඳුන්වා ඇත්තේ අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් බව මහාචාර්ය නන්දසේන මුදියන්සේ පෙන්වා දෙයි.[31] බෝධිසත්ත්ව වන්දනය අනුරාධපුර අවසාන භාගය වන විට ප්‍රචලිත වුවත් බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය ආරම්භ වූයේ කවදා දැයි ස්ථිර වශයෙන් ම නිගමනය කිරීම දුෂ්කර ය. සාම්ප්‍රදායික ප්‍රතිමා ශිල්පය මගින් අවධාරණය වන අවලෝකිතේශ්වර සංකේතවල පදනම වන්නේ රාජබලය, ඍෂි බලය, බෝධිසත්ත්ව ගුණෝපේත පරහිත කාරුණ්‍යය බවට අචාර්ය ජෝන් හෝල්ට් පවස යි.[32] මෙම සංකේත පසු කාලීනව දෙවියන් නිරූපණය කිරීම සඳහා භාවිත කරන ලදී. ශිල්පියා මුල් අවස්ථාවේ අවලෝකිතේශ්වර ප්‍රතිමා නිර්මාණය කිරීමේදී එහි වඩාත් ඉස්මතුකොට දැක්වූයේ ඍෂි ලක්ෂණ යි. නමුත් පසුකාලීනව රාජ ලක්ෂණ ප්‍රබලව දැක්වීමෙන් ලෞකික දෙවියෙකු නිර්මාණය කරයි.

මහායාන බෞද්ධයෝ මෛත්‍රේය බෝධිසත්ත්වයන්ට වඩා ප්‍රමුඛස්ථානයක් ලද අවලෝකිතේශ්වර මිනිසුන්ගේ ගැලවුම්කාරයෙකු ලෙස සලකති.[33] නුවණට අධිපති මෙතුමා වර්තමාන භද්‍රකල්පයේ අධිපතියා ලෙස විශ්වාස කෙරේ. මෙරට අවලෝකිතේශ්වර ප්‍රතිමා නිර්මාණය කිරීමේදී මහායානයට නැඹුරු වූ අංගෝපාංග සියල්ල ම ඊට අන්තර්ගත කළේ ද යන්න සැක සහිත ය. ඒ සඳහා බලපෑ ප්‍රධාන

28 **EZ.** I, 75-115pp.

29 **EZ.** I, 33p.

30 **EZ.** I, 75-115pp.

31 මුදියන්සේ, (1971), 174-178 පිටු.

32 ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට්, **මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය**, (පරි.), පී.බී. මීගස්කුඹුර, (කොළඹ: ප්‍රදීප ප්‍රකාශන, 1994), 96 පිට.

33 හේරත්, යමුනා, **ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා හා රූකම්**, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2003,186 පිට.

හේතුව වූයේ ථෙරවාදී බුදුසමය තුළට මහායානික ධර්ම කොටස් එකතුව සකස් වූ ආගමික ව්‍යුහයක් තුළ මෙම නිර්මාණ සිදු කිරීමට කලා ශිල්පියාට සිදුවීමයි.

දැනට හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව ශ්‍රී ලංකාවේ අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය කිරීමේදී කලා ශිල්පීන් එකම සම්ප්‍රදායක් අනුගමනය කර නැත. හිටි සහ හිඳි ඉරියව්වේ බෝධිසත්ත්ව ප්‍රතිමා ප්‍රමාණයෙන් කුඩා, මධ්‍යම හා විශාල ප්‍රමාණයෙන් නිමවා ඇත. මෙහිදී හිටි ඉරියව්වේ ප්‍රතිමා සමභංග සහ තිභංග ක්‍රමයට නිර්මාණය වී තිබේ. හිටි ඉරියව්වට අමතරව හිඳි ඉරියව්වේ බෝධිසත්ත්ව ප්‍රතිමා වීරාසන, රාජලීලාසන, භද්‍රාසන, ලාලිතාසන යනාදී ආසන ක්‍රම යොදා තිබෙන බව පෙනේ. ශෛල, ලෝකඩ, දැව, ඇත්දත්, ගඩොල් හෝ බදාම ආදී විවිධ අමුද්‍රව්‍ය භාවිතයෙන් නිර්මිත ප්‍රතිමා ඇත.[34] බෝධිසත්ත්ව ප්‍රතිමාවල ශීර්ෂය සකස් කිරීම සඳහා නිර්මාණ ශිල්පියා ක්‍රම දෙකක් අනුගමනය කළ බව පෙනේ. එනම් ජටාමකුට සහ කිරීටමකුට යනුවෙනි. දඹේගොඩ සහ ගිරිදර අවලෝකිතේශ්වර ප්‍රතිමාවල ශීර්ෂය සකස් කර ඇත්තේ ජටාමකුට ඇසුරෙනි. බෝධිසත්ත්ව ප්‍රතිමාවන්ගේ දෑත්වලින් පද්මය හා වජ්‍රය ආදී වස්තූන් දරා සිටින ආකාරයක් ද දක්නට ඇත.[35] ප්‍රස්තුත කාල වකවානුව තුළ මෙරට නිර්මාණය වූ බෝධිසතත්ව ප්‍රතිමා ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය. එනම්, නිර්භූෂණ (යෝගී අවලොකිතේශ්වර) සහ විභූෂණ (රාජකුමාර අවලෝකිතේශ්වර) වශයෙනි. නිර්භූෂණ ප්‍රතිමාවල ආභරණ නොමැති අතර විභූෂණ ප්‍රතිමා ඇඳුම් පැලඳුම්වලින් යුක්ත ය.

හින්දූන්ගේ ප්‍රධාන දෙවියා වූ ශිවගේ (යෝගී ශිව) රූපය අනුකරණය කර මහායාන සම්ප්‍රදාය තුළ යෝගී අවලෝකිතේශ්වර ප්‍රතිමාව සකස්කර ඇත.[36] මෙම පිළිම කලාව ද දිවයින තුළ ප්‍රචලිත වන්නේ පල්ලව රාජවංශය නිසා බවට මහාචාර්ය ඩී.කේ. දොහානියන්ගේ අදහස වේ.[37] මොහු එසේ ප්‍රකාශ කර ඇත්තේ ඩෙකෑනයෙන් නැගෙනහිර පිහිටි පල්ලව රාජ්‍යයේ ක්‍රි.ව. 6 හා 7 වැනි සියවස්වලදී මේ ක්‍රමයට සමානව ප්‍රතිමා නිර්මාණය කර ඇති නිසා ය.[38] මාමල්ල පුරම්හි ත්‍රිමූර්ති ලෙන් ශිව රූපයට සාකල්‍යන් ම මේ බෝධිසත්ත්ව පිළිමයේ ශෛලිය සමාන වන බව කියයි. යෝගී අවලෝකිතේශ්වර වර්ගයේ හිටි හා හිඳි පිළිම ශ්‍රී ලංකාවෙන් සොයාගෙන තිබේ. ගිරිදර, හිරිහඬු, බුදුමුත්තෑව, සිතුල්පව්ව, බුදුරුවගල, මූදු මහවිහාරය, දඹුල්ල ආදී ස්ථානවල මෙම වර්ගයට අයත් ප්‍රතිමා දැකගත හැකි ය. මෙම ප්‍රතිමා බොහෝමයක් සමභංග ඉරියව්වෙන් නිරූපිත වුවත් තිභංග ආකාරයේ ප්‍රතිමා ද ඇත.[39] මේවායෙහි කැපී පෙනෙන ලක්ෂණය වන්නේ අභරණ රහිත ව උඩුකය චාම් ලෙස නිර්මාණය කර තිබීමයි. භද්‍රාසන ඉරියව්ව අම්බලන්ගොඩින් ලැබූ මෛත්‍රිය ප්‍රතිමාවේ දක්නට ලැබේ. මෙම වර්ගයට අත් ලලිතාසන ඉරියව්වෙන් ඇති ප්‍රතිමාවක් ඇමරිකාවේ බොස්ටන් කෞතුකාගාරයේ ඇත.[40] රාජලීලාසන සහ ලාලිතාසන යන හිඳි ඉරියව් දෙක ම එක ම ප්‍රතිමාවක් මගින් පෙන්වීමට නිර්මාණ ශිල්පියා සමත් බවට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ සහ වෙහෙරගල අවලෝකිතේශ්වර ප්‍රතිමා සාක්ෂ්‍ය දරයි.

බුද්ධ ප්‍රතිමාවක් දෙපස බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය කර අම්බලන්තොට, සිතුල්පව්ව, බුදුරුවගල, සහ දඹුල්ලේ දක්නට ඇත. බුදුරුවගල[41] ප්‍රතිමාව දෙපස බෝධිසත්ත්ව ප්‍රතිමා සහ ඔවුන්ගේ ශක්තීන්ගේ ප්‍රතිමා තුන බැගින් හයක් නිර්මාණය කර තිබෙන ආකාරය දක්නට ලැබේ.[42] මෙලෙස නිර්මාණය කර ඇති එක ම ස්ථානය මෙය පමණි. මෙබඳු ප්‍රතිමා සියල්ල ම සිංහනාද අවලොකිතේශ්වර ප්‍රතිමා ගණයට අයත් බව මහාචාර්යය ඩී.කේ. දොහානියන්ගේ අදහස වේ.[43]

අංග සම්පූර්ණ රාජකුමාර ඇඳුම් පැලඳුම්වලින් යුක්ත අවලෝකිතේශ්වර ප්‍රතිමා මෙරටින් හමුවේ. සංරක්ෂණය කර ඇති දඹේගොඩ සෙල්මුවා පිළිමය ඊට කදිම උදාහරණ වේ. සමභංග ඉරියව්වෙන්

34 Mudiyanse, N. **Mahayana Monuments in Ceylon**, Gunasiri, Colombo, 1976, pp. 92- 95.

35 Schroeder, Ulrich, **Buddhist Sculptures of Sri Lanka**, Visual Damma Publication Ltd, Hong Kong, 1990, pp. 215 -221.

36 වික්‍රමගමගේ, 2006, 66 පිට.

37 Dohaniyan, D.G. **Mahayana Buddhist Sculpture of Ceylon**, Culcuta, 1994, p. 46.

38 Ibid.,

39 Dohaniyan, 1994, 46p.

40 වික්‍රමගමගේ, (2006), 16 පිට.

41 එම., 67 පිට.

42 Dohaniyan, (1994), 31- 34pp.

43 Iibd.,

නිර්මිත මෙම ප්‍රතිමාවේ දකුණතින් වරද මුද්‍රාවත්, වමතින් පත්මයක් ද දරා සිටී. මෙම ප්‍රතිමාවෙහි සිරසෙහි ධ්‍යානි බුද්ධ රූපයක් මධ්‍යයෙහි කැටයම් කර තිබෙන ජටාමකුටය ආභරණවලින් සමන්විත ය.[44] මෙම වර්ගයට අයත් බෝධිසත්ත්ව ප්‍රතිමාවක් බුදුරුවගල ඇති අතර සමභංග ඉරියව්වෙන් සකසා තිබීම කැපී පෙනේ. රාජකුමාර අවලෝකිතේශ්වර ප්‍රතිමාවක් ලෙස හඳුනාගන්නා වැලිගම කුෂ්ටරාජගල පිළිමය සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් අදහස් පවතී.

අනුරාධපුරයේ රාජධානිය බිඳ වැටී නව රාජධානිය ලෙස පොළොන්නරුව පත්වීමෙන් පසු මහායානික අදහස් එතරම් දුරට ප්‍රචලිත වූ බවක් කිව නොහැකි ය. ඒ සඳහා හේතු වන්නේ උතුරු ඉන්දියානු බලපෑම ප්‍රචලිතවීම සහ බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන්වා ථෙරවාදී බුදු සමය නැවත ස්ථාපිත වී තුන් නිකායම සමගිය ඇතිවීම යන කරුණු බලපාන්න ඇත. නමුත් සාම්ප්‍රදායික බෝධිසත්ත්ව ප්‍රතිමා ලක්ෂණ දක්නට නොලැබෙන එහෙත් බෝධිසත්ත්ව ප්‍රතිමාවක් බවට විද්වතුන් අනුමාන කරනු ලබන ප්‍රතිමාවක් පොළොන්නරුව දළදා මළුව නමින් හඳුන්වනු ලබන ස්ථානයේ හමුවී ඇත. එහි ජටාමකුටයේ කුහරයක් තිබුණා ද? යනුවෙන් කුමන හෝ ලක්ෂණයක් දක්නට නොමැත. ආළාහන පිරිවෙනෙහි තිබී හමුවූ සිරස විනාශව ඇති ප්‍රතිමාව අවලෝකිතේශ්වර ප්‍රතිමාවකි. කෙසේ වෙතත් අනුරාධපුර යුගයේදී මෙන් බහුල වශයෙන් බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය පොළොන්නරු යුගයේදී සිදු නොවූ බව හෙළි වේ. රාජධානි නිරිතදිගට විතැන් වී ගම්පල යුගයේදී අවලෝකිතේශ්වර නාථ බවට පත්වී ජන සමාජයේ ප්‍රචලිත වූ බව කිව හැකි ය.[45]

මෙරට හමුවන අවලෝකිතේශ්වර ප්‍රතිමා අතර තිරියායෙන් හමු වූ ප්‍රතිමාවට හිමි වන්නේ සුවිශේෂී වැදගත්කමකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රතිමා හයක් සොයාගත් අතර එකී සියල්ල අවලෝකිතේශ්වර ප්‍රතිමා ලෙස හඳුනාගෙන තිබේ.[46]එසේ පැවසීමට හේතු වී ඇත්තේ ජටාමකුටයෙහි ධ්‍යානි බුදු රුවක් තිබීමයි. ආචාර්ය ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් පවසන්නේ මෙම ධ්‍යානි බුදුරුව අමිතාභ මුනිඳුන්ගේ බවයි.[47] අවලෝකිතේශ්වර හා මංජු ශ්‍රීටත් සුළු වශයෙන් හයග්‍රීමටත් පොදු ප්‍රතිමා ලක්ෂණයක් වන මෙය පූර්ව මධ්‍යකාලීන සිංහලයන් විසින් සිය දෙවිවරුන් අවසානයේ බුදුවන බැව් සංකේත කිරීම සඳහා යොදා ගන්නා ලදී.[48] අවලෝකිතේශ්වරගේ ශක්තිය වන තාරාගේ පිළිම දෙකක් ද තිරියායෙන් හමුව තිබේ. මෙම ප්‍රදේශයේ හමුවන ප්‍රතිමා එකම ආකාරයෙන් හෝ එකම තත්ත්වයෙන් නොපවතී. එකී පිළිම එලෙස පැවතීමෙන් පැහැදිලි වන්නේ පූර්ව මධ්‍යකාලීන යුගයේ මෙම ආගමික සංකල්පය මුල් වරට ලැබෙන විට ප්‍රතිමා තුළ විවිධත්වයක් පැවති බවයි. අවලෝකිතේශ්වර බෝසතුන් ඍෂිවරයෙකු ලෙස නිරූපණය කරමින් ක්‍රි.ව. 6 සහ 7 සියවස්වලට අයත් ප්‍රතිමාවක් ලෙස තිරියාය මෙම පිළිමය සැලකිය හැකි ය.[49]

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිතුල්පව්වේ ඇති යෝගී අවලෝකිතේශ්වර පිළිමය මෙරටින් හමුව ඇති පැරණිතම පිළිමය වේ. ලංකාවේ හමුවූ පැරණිතම අවලෝකිතේශ්වර පිළිමය සිතුල්පව්ව ප්‍රතිමාව බව මහාචාර්ය දොහානියන් විසින් පෙන්වා ඇත. එය මාමල්ල පුරම්හි ත්‍රිමූර්ති ගුහාවේ ශිව රූපය සමඟ සැසඳෙන බැවින් ක්‍රි.ව. හත්වෙනි සියවසේ දෙවන භාගයට අයත් බව පවසයි.[50] මහාචාර්ය සෙනරත් පරණවිතාන පවසන්නේ එය ක්‍රි.ව. හයවෙනි සියවසට අයත් බවයි.[51] සෙල් පිළිමයක් වූ මෙය සමභංග ඉරියව්වෙන් යුක්ත ය. කාලයාගේ ඇවෑමෙන් අව්, වැසි නිසා ක්‍රමයෙන් විනාශ වී ඇති මෙම පිළිමයෙහි වමත හා දකණත වැලමිටට ඉහළින් කැඩී ඇති අතර වම් පතුල ද සුළු වශයෙන් හානි වී පවතී. මෙහි කිසිදු රාජ ලක්ෂණයක් නිරූපණය නොවුණත් සමතාව හා සන්සුන් බව මැනවින් නිරූපණය වේ.[52] එහි අලංකාර ලක්ෂණ ද සංකීර්ණ නොවන අතර වස්ත්‍ර රැළි සහිතය, ශිර්ෂාභරණ අලංකෘත

44 Iibd.,

45 Nandana Chatiwona, **The Iconography of Awalokiteshvara in Mainland of South East Asia**, (Thailand: 1942), 136p.

46 Mudiyanse, (1976), 45p.

47 හෝල්ට්, (1994), 99 පිට.

48 එම.,

49 Mudiyanse, (1976), 41p.

50 Dohanian, (1974), 32p.

51 පරණවිතාන, (1962), 181 පිට.

52 හෝල්ට්, (1994), 103 පිට.

ය. කිරීටමකුටය ඉදිරිපස ඉහළින් ධ්‍යානි බුද්ධ ප්‍රතිමා නිසා අවලෝකිතේශ්වර බෝසතුන්ගේ බව පෙනේ.[53] ආරෝහපරිනාහයෙන් හා කඩවසම් බවින් අනූන මෙම ප්‍රතිමාවෙන් සුවිනීත හා කරුණාන්විත හැඟීමක් පිළිබිඹු වෙයි. සම්පූර්ණයෙන් ම රවුම්ව නෙළා ඇති නිසාත්, පරිමාණයේ සිත් බැඳගන්නා ලක්ෂණ නිසාත් ඉමහත් ස්ථිර ස්භාවය, තැන්පත් උදාර බව හා ආකෘතියේ චාම් බව නිසා මෙම ප්‍රතිමාව මිනිස් වර්ගයා සතු අවලෝකිතේශ්වර බෝසතුන්ගේ විශිෂ්ටතම ප්‍රතිමාව බවට පත්වෙයි.[54]මෙම ප්‍රතිමාවෙන් විශ්වාසදායක භක්තිය, සාමය හා මහෝත්තමභාවයේ ආලෝකය නිරූපණය වේ.[55] ආචාර්ය ජෝන් හෝල්ට් පවසන්නේ අවලෝකිතේශ්වර බෝසතුන් ඍෂිවරයෙකු වශයෙන් නිරූපණය කිරීමට මුලදී තිබූ නැඹුරුව සිතුල්පව්ව ප්‍රතිමාවෙන් පෙනෙන බව ය.[56]

අනුරාධපුර දිස්ත්‍රික්කයේ වෙහෙරගලින් ලැබී ඇති දැනට කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති අවලෝකිතේශ්වර මූර්තිය කලා ව්‍යවච්ඡේදය අතින් අසාමාන්‍ය නිර්මාණයකි. ලෝකඩවලින් එක ඝනව තනා රන් ආලේපකර ඇති මෙත් බෝසත් ලෙස අනුමාන කළ හැකි බවට කඹුරුපිටියේ වනරතන හිමියෝ පෙන්වා දෙති.[57] එනමුත් එය අවලෝකිතේශ්වර ප්‍රතිමාවකි. මෙරට අනෙකුත් ප්‍රතිමාවලට ඉරියව් දක්නට ඇත. දකුණු පය නවා තිරස් අතට ආසනය මත තබා අනෙක් පය පහත හෙළා රාජලීලාසන ක්‍රමයට හිඳ දකුණු කලවය මත රඳවාගත් දකුණු අතින් විතර්ක මුද්‍රාව දක්වයි. වමත වම් කලවයට පිටින් ආසනය මත තබාගන සිටී. යටිකයේ ඇඳුම් කෙටි ය. එහි කොටසක් ඉදිරියෙන් ආසනය පහළට වැටී ඇති අයුරින් නිර්මාණ කර තිබේ. හිසේ ජටා මකුටය අලංකාරය. එහි ඉදිරිපස හිස් විමානයක් දැකගත හැකි ය. මෙහි කිරීට මකුටයත් දෑතේ වළලු දෙකත් හැර කිසිදු ආභරණයක් නැති වුවත් ඉතා චාම්ය. මෙම ප්‍රතිමාවේ ලක්ෂණ අනුව ක්‍රි.ව. 8-9 වර්ෂවල නිර්මාණය වන්නට ඇතැයි සැලකිය හැකි ය.

අම්බලන්තොට ගිරිහඬු විහාරයේ අවලෝකිතේශ්වර ප්‍රතිමා හිස ක්‍රි. ව. අටවන සියවසේ පසු කාලය හෝ නවවන සියවසේ මුල් කාලයට අයත් වූවකි.[58]මෙහි හිස අවලෝකිතෙශ්වර ප්‍රතිමාවකට අයත් විය යුතුයැයි සිතිය හැක්කේ මකුටයේ ඇති අමිතාභ බුද්ධ රූපය නිසා හා උකුළ සහ උඩුකය වටේ පොරවා ඇති කොටි සම නිසා ය. ප්‍රතිමාව නිරීක්ෂණය කිරීමේදී ජටාමකුටය සැකසීමේ දියුණුවක් පෙන්වයි. වැඩි අවධානයක් යොමු කර ඇත්තේ තිරස් ලෙස ගෙතූ කෙස් කැරලි කෙරෙහි ය. ඒවා එකක් මත එකක් සිටින සේ ගොඩනගා ඇත්තේ සිලින්ඩරාකාරයෙන් ඉහළට එසෙවන පරිදි ය. වළලු ලෙස කුඩා මුදු ගොඩ ගසා ඇත්තේ එමගින් මකුටයේ මුදුන සැකසෙන ලෙස ය. මෙහි නැහැය, දෙතොල, නිකට සහ මුහුණේ සුළු ස්ථාන විනාශවී ඇතත් එහි ලක්ෂණ මැනවින් හඳුනාගත හැකි ය. මන්දස්මිතිය සහිත මුහුණින් හා දෑසින් කරුණාබරිත ස්වරූපය පිළිබිඹු වෙයි. මුහුණේ ඉන්ද්‍රිය ශෝභන අයුරින් දැක්වීමට ශිල්පියා සමත්වී ඇත. අනුරාධපුර යුගයේදී දියුණු කරගන්නා ලද ශිල්පීය නිපුණතාව මෙමගින් පැහැදිලි වේ.

බුද්ධ ප්‍රතිමා කලාවේ විශිෂ්ට නිර්මාණ එකතුවකින් සමන්විත ස්ථානයක් වන්නේ දඹුලු විහාරය යි. එකම ස්ථානයකදී අනුරාධපුර, පොළොන්නරු සහ මහනුවර යුග තුනකට අයත් නිර්මාණ තිබේ.[59] මෙම ලෙන් විහාරයේ යෝගී අවලෝකිතේශ්වර සහ රාජකුමාර අවලෝකිතේශ්වර වශයෙන් වර්ග දෙකකට අයත් ප්‍රතිමා තිබේ. අංක දෙක දරන විහාරයේ අටවන සහ නවවන සියවස්වලට අයත් මෙම ප්‍රතිමාව උස මීටර් 2.85 ක් වේ.[60]මෙම් ප්‍රතිමාවේ ද දක්නට ඇති පොදු ලක්ෂණය වන්නේ උකුල සහ පපුව වටේ එතුණ කොටි සමකි. මෙහිද මකුටයේ බුදුරුවක් ඇත. සිරුරේ ප්‍රමාණයට සාපෙක්ෂව දෑත් කුඩා බවක් පෙනෙන අතර අලංකාර මාල සහ බාහු පලඳනා ද දක්නට ඇත. මෙම ප්‍රතිමාව වර්ණවත්

53 ලගමුව, (1997), 109 පිට.

54 **ශ්‍රී ලංකා මූර්ති**, (සංස්.), නන්දන චුට්වොනස්, ලීලානන්ද ප්‍රේමතිලක, සහ රෝලන්ඩ් සිල්වා, (පරි.), උදය මැද්දේගම, (කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල, 2011), 18 පිට.

55 **එම.**,

56 හෝල්ට්, (1994), 103 පිට.

57 කඹුරුපිටියේ වනරතන හිමි, **අනුරාධපුර නටබුන්**, (මාතර: 1970), 94 පිට.

58 **ශ්‍රී ලංකා මූර්ති**, (සංස්.), නන්දන චුට්වොනස් සහ වෙනත් අය, 16 පිට.

59 අනුරාධ සෙනෙවිරත්න, **රන්ගිරි දඹුලු රජ මහා විහාරය**, (කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල, 1995), හැඳින්වීම.

60 **ශ්‍රී ලංකා මූර්ති**, (සංස්.), නන්දන චුට්වොනස් සහ වෙනත් අය, 100 පිට.

ය. එමගින් මහනුවර යුගයේ වර්ණ පද්ධතියක් නිරූපණය වේ. මෙම විහාරයේම එකිනෙකට වෙනස් ඇඳුමෙන් සැරසී සිටින ප්‍රතිමාවක් තිබේ.

සාම්ප්‍රදායිකව මෙම දෙදෙනා මෛත්‍රී සහ නාථ ලෙස හඳුනා ගත හැකි ය.[61] මෙම විහාරයේ අංක එක දරන විහාරයේ ද මකුටයේ අමිතාභ බුදුන්ගේ රුව සහිත ප්‍රතිමාවක් ඇත. ප්‍රදේශයේ පවතින ජනප්‍රවාදවලට අනුව මෙම ප්‍රතිමාව විෂ්ණු ලෙස විශ්වාස කෙරේ. මෙය නිරීක්ෂණයෙන් එය සනාථ නොවේ. මෙම ප්‍රතිමාව කවර කලකදී ඉදිකලා ද යන්න පැහැදිලි නැතත් බාහිර ස්වරූපය අනුව අටවන සහ දහවන සියවස්වලට අයත් බව අනුමාන කළ හැකි ය. ඉහත කරුණු අනුව බැලීමේදී දඹුලු විහාරයේ ද අවලෝකිතේශ්වර වන්දනය පැවති බව පෙනේ.

බොස්ටන් කෞතුකාගාරයේ ඇති ත්‍රිභංග ලෝකඩ අවලෝකිතේශ්වර මූර්තිය මෙරට නිර්මාණ ශිල්පියාගේ වැදගත් නිර්මාණයකි. මෙම ප්‍රතිමාව ද යෝගී වර්ගයට අයත් එකකි.[62]මෙම මූර්තියේ දකුණු අතින් වරද මුද්‍රාව නිරූපණය වේ. මෙහි බාහිර ස්වරූපය පිළිබඳව අවබෝධයක් ලබාගත යුතුය. මෙම ප්‍රතිමාව තුළ දකුණු පාදය දණහිසින් නවා පතුල සහ දණහිස සිරුරට විරුද්ධ දෙසට සිටින සේ අසුන මත තබා තිබෙන්නා සේ වම් පාදය දණිසෙන් පහලට එල්ලෙන සේ ඇත. ධෝතිය දණිස අසලින් කෙළවර වී ඇත. ප්‍රතිමාවේ උදර බන්දය ඉණට තදට ඇති අතර එහි රැලි දෙපා මැද ගොනුවී තිබේ. ආභරණ රහිතව ඇති මෙම ප්‍රතිමාවේ ගාත්‍රා විධිමත් අයුරින් සකසා ඇත. පිරිපුන් මුහුණට උචිත අයුරින් ඉන්ද්‍රිය සකසා ඇත. ස්තූපය බදු සිරස මුදුනේ ධ්‍යානි බුද්ධ ප්‍රතිමාවක් දක්නට ඇත. මහාචාර්ය ආරිය ලගමුව පවසන්නේ මෙම ප්‍රතිමාව ක්‍රි.ව. 8-9 සියවස්වලට අයත් බවයි.[63]

ගිරිදරින් සොයාගත් අවලෝකිතේශ්වර ප්‍රතිමාව ද ක්‍රි.ව. 6-7 සියවස්වලට අයත් ප්‍රතිමාවක් වශයෙන් හඳුනාගත හැකි ය. මෙම මූර්තිය ජාතික කෞතුකාගාරයේ දක්නට ඇත. මෙම ප්‍රතිමාව නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි වන්නේ ඝණ ලෝහ වාස්තු නිර්මාණයක් බවයි. මෙම ප්‍රතිමාවේ ප්‍රමාණය ගත් විට උස අගල් 12.3 පමණ වන අතර උරහිස් අතර පළල 2.3 කි. උඩුකය නිරාවරණය වී ඇති අතර කිසිදු ආභරණයක් දක්නට නැත. ඉඟ සිහින් වන අතර පපුව පළල්ව ඇත. ආභරණ විරහිත දෑතේ වමතින් ව්‍යාඛ්‍යාන මුද්‍රාව දැක්වෙන අතර දකුණත විවෘත නමුත් පවතින්නේ අභය මුද්‍රාවයි පැවසිය නොහැකි ය. එය දේශනා විලාසයේ මුද්‍රාවක් නිරූපණය කරන බවට නන්දදේව විජේසේකර පවසයි.[64] මෙහිද පිරිපුන් මුහුණට උචිත අයුරින් ඉන්ද්‍රිය සකසා ඇත. උරහිස දක්වා දික් වූ කන් විද ඇති අතර එමගින් ආභරණ පළඳින බවට සලකුණකි. හිසෙහි අලංකාර මකුටයක් තිබේ. මෙහි ප්‍රතිමා විද්‍යාත්මක ලක්ෂණ අනුව සමාන බවක් දක්වන්නේ දකුණු ඉන්දියාවේ ආන්ධ්‍ර සහ පල්ලව ශෛලීන්ටය.[65] කේස කලාපය සකසා ඇත්තේ එම ඉන්දියානු ශෛලී තවදුරටත් වැඩි දියුණු කරගනිමිනි. ඉන්දියානු නොවන මුහුණුවරින් ශ්‍රී ලංකාවේ දේශීය ලක්ෂණ වඩාත් පැහැදිලි වන අතර දකුණු ඉන්දියානු රීතිමය අංග ගුප්ත සම්ප්‍රදාය සමඟ සංකලනය වී ඇත.[66] ජේතවන විහාර භූමියෙන් ලැබුණු අවලෝකිතේශ්වර ප්‍රතිමාව ද කලාත්මක නිර්මාණයකි.

දැනට මෙම ප්‍රතිමාව ජාතික කෞතුකාගාරයේ ඇති අතර දහවන සියවසේ පමණ නිර්මාණය වන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. එය උස සෙන්ටි මීටර් 21.8 වන අතර විතර්ක සහ කටකහස්ත මුද්‍රාවෙන් නිරූපිත ය. මෙහිද උස්ව සැකසුණු මකුටයේ ඇත්තේ බුද්ධ රූපයක් හෝ මාණික්‍යක් විය හැකි ය. විසිතුරු ආභරණවලින් සැරසී සිටින මෙම ප්‍රතිමාව පද්මයක හැඩය ගත් පාදස්ථලය රශ්මිමාලාවක් සවි කිරීමට හැකි වන අයුරින් තිබේ. තවද එය එතරම් විශාල නොවෙතත් ස්ථාවරත්වයක් අඟවන මහත් උදාරත්වය නිසා අතිශයෙන් සිත් කාවදින නිර්මාණයකි.[67] ජේතවනය තුළ සිටි මහායාන මතධාරී භික්ෂූන් මෙම ප්‍රතිමාව පුදන්නට ඇත විශ්වාස කළ හැකි ය.

අනුරාධපුර රාජධානි සමයේ බොහෝ ආගමික කටයුතු ඉතා ඉක්මනින් හා පහසුවෙන් රෝහණයට

61 කේ. ආනන්ද කුමාරස්වාමි, **මධ්‍යකාලීන සිංහල කලා**, (කොළඹ: මුද්‍රණාලය, 1962), 156 පිට.
62 Dohanian, (1994), 39p.
63 ලගමුව, (1997), 120 පිට.
64 නන්දදේව විජේසේකර, "**පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය**" (පරි.), සී. ඒ. විජේසේකර, (කොළඹ: 1970), 284 පිට.
65 **ශ්‍රී ලංකා මූර්ති**, (සංස්.) නන්දන චුට්වොනස් සහ වෙනත් අය, 62 පිට.
66 **එම.**,
67 **එම.**, 70 පිට.

ද බලපෑවේ ය. සමස්තයක් වශයෙන් අපේ ඉතිහාසය පුරා ම මෙම තත්ත්වය පැහැදිලි ව ම විද්‍යමාන වෙයි. මහායාන මතවාද රෝහණ රාජ්‍යය ඇසුරෙන් ද ප්‍රචලිත විය. රුහුණේ මහායාන මත ව්‍යාප්ත කිරීමේදී මහායානිකයන් විසින් අනුගමනය කර ඇත්තේ ආක්‍රමණශීලී ප්‍රතිපත්තියකට වඩා උපායශීලී ක්‍රමයකි. මහායානිකයන් ස්වකීය මහායාන මත ව්‍යාප්ත කිරීමේදී බැහැරින් සිට ශක්තිමත් වීමේ න්‍යාය රුහුණේදී ක්‍රියාත්මක කර ඇත.[68]අනුරාධපුරයේ ථෙරවාදි මූලස්ථානය මහා විහාරය ක්‍රියාත්මක වූ අතර රුහුණේ තිස්සමහාරාම විහාරය ද පුළුල් කාර්ය භාරයක් ඉටුකරන ලදී. පිහිටි රට සීමාව මහවැලි ගඟ වුවාක් මෙන් ම, රුහුණේ ථේරීය ආගමික සංකීර්ණයේ සීමාව වූයේ යාල වන සීමාවයි. මහායානිකයන් සිය බල ප්‍රදේශය වශයෙන් තෝරා ගත්තේ යාල වන සීමාව වූ දඹේගොඩයි. මේ ප්‍රදේශයේ මහායාන වාදය තොතරම් සරු ලෙස ස්ථාපනය වී තිබුණේ ද යන්න තදාශ්‍රිත ව සොයාගෙන ඇති නටබුන්වලින් මනාව හෙළිදරව් වෙයි.

ලංකාවේ හමුවන බෝධිසත්ත්ව ප්‍රතිමා අතර දඹේගොඩ ප්‍රතිමාව මෙරට ඇති විශාලතම හිටි පිළිමයයි. හුනු ගලෙන් නෙළන ලද මෙය අඩි 45ක් උස ද අඩි 10ක් පමණ උරහිස් හරහා පළල ද ඇති මූර්තියකි.[69] මෙම ප්‍රතිමාව ඉදිකර ඇත්තේ පළමුවන දප්පුල රජු විසිනි.[70] වංස කථාවේ සඳහන් වන අන්දමට එය මෛත්‍රේය බෝධිසත්ත්ව ප්‍රතිමාවකි. එනමුත් මහාචාර්ය සෙනරත් පරණවිතාන මෙය අවලෝකිතේශ්වර ප්‍රතිමාවක් ලෙස හඳුනාගෙන තිබේ.[71] ඊට හේතුව මෙම ප්‍රතිමාවේ මකුටයේ සමාධි ප්‍රතිමාවක් යොදා තිබීම ය. මෛත්‍රී බෝධිසත්ත්ව රූපයක නම් එහි තිබිය යුත්තේ ස්තූපයක සටහනකි. ඒ වගේ ම කණගාමයේ සෘද්ධියෙන් මැව්වාක් වැනි මහත් වූ ශෛල ප්‍රතිමාව[72] මෙය බව සෙනරත් පරණවිතාන තවදුරටත් පවසයි.[73] ඇතැම් විට මෙම ප්‍රතිමාව වෙනත් ස්ථානයකදී නෙළා ගෙනවිත් දැනට තිබෙන ස්ථානයේ පද්මාසනය මත ඉදි කරන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය.

උස් වූ බිම් පෙදෙසක නිර්මිත මෙම ප්‍රතිමාව 1934 දී සොයා ගන්නා විට ඇද වැටී කැබලි 50 කට අධික සංඛ්‍යාවකට වෙන්වී තිබුණු බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරයි.[74] එහෙත් වර්තමානය වන විට මෙය සියුම් අන්දමින් ප්‍රතිසංස්කරණය කර ඇත. මෙම ප්‍රතිමාවෙහි සුවිශේෂී ලක්ෂණ කිහිපයකි. එනම් කිසියම් ආධාරයක් නොමැතිව සිරස් අතට පිහිටි පොළොවෙහි ස්ථාපනය කර ඇති අතර එය ලොව විශාලතම බෝධිසත්ත්ව ප්‍රතිමාවයි.[75] පිළිමයේ හිස වෘත්තාකාර කෙස් පිඬු සහිත ය. උෂ්ණිෂයක් හෝ සිරස්පතක් තිබුණ බවට සාධක නොමැත. ඇස්, ඇහිබැමි, දෙතොල, හා නාසය යනාදිය ක්‍රමානුකූලව නෙළා තිබේ. ඒකාංශ චීවරය දිය රැළි මාලා වැනි රැළිවලින් සමන්විත ය. මුහුණ රැස් වෙහෙර ප්‍රතිමාවේ මෙන් වෘත්තාකාර ය. උස ප්‍රමාණයට සරිලන මහතකින් යුක්ත ය. නෙත්වලින් ගාම්භීර ස්වරූපය පිළිබිඹු වෙයි. මුහුණ හා ශරීරය දශබලධාරී ගුණයෙන් අනූන ය. මෙම ප්‍රතිමාව ඊට ඔබින ප්‍රතිමා ගෘහයක පිහිටුවා තිබූ බව ශේෂව පවතින නටබුන් සාක්ෂි දරයි. අලුත් වැව සෝරත හිමියන් පවසන්නේ මෙම විහාරය මහාවංසයේ සඳහන් අරියාකාර විහාරය විය හැකි බවයි.[76]

ඌව පළාතේ වැල්ලවායෙන් සොයාගන්නා ලද බුදුරුවගල අවලෝකිතේශ්වර ප්‍රතිමාව ද කලාත්මක නිර්මාණයකි. හිඳි ප්‍රතිමාවක් වූ මෙය උස අගල් 3. 11 යුක්ත ය. මෙහි රූප විද්‍යාත්මක ලක්ෂණ ආසියාව පුරා මහායාන රටවල ජනප්‍රියව පැවති අවලෝකිතේශ්වරගේ ප්‍රතිමා පිළිබඳ සම්මතයන්ට අනුකූලව දක්නට ලැබේ.[77] ප්‍රතිමා ශෛලිය අනුව 8-10 සියවස් තුළ ඊසාන දිග ඉන්දියාවේ පාල සම්ප්‍රදාය හා සමීප බවක් පෙන්වයි.[78] පද්ම පීඨයක් මත සුඛාසනයෙන් හිඳ සිටින මෙහි සියුම් අංග ලක්ෂණ බොහෝමයක් ගෙවී ඇත. දණහිස අසලින් නමන ලද දකුණු පාදය ආසනයෙන් පහළට වැටෙන අතර

---

68 අළුත්වැවේ සෝරත හිමි, **බෞද්ධ රෝහණය**, 113 පිට.

69 ලගමුව, (1997),74 පිට.

70 **මහාවංසය**, 43 පරි., 62 ගාථාව.

71 **පුරාවිද්‍යා පාලන වාර්තාව**, (1934), 36 පිට.

72 **මහාවංසය**, 45 පරි., 43-44 ගාථා.

73 **ASCAR**. 21- 22 pp.

74 **පුරාවිද්‍යා පාලන වාර්තාව**, (1934), 36 පිට.

75 **ඌව වංශකථාව, පළමු කාණ්ඩය**, 23 පිට.

76 සෝරත හිමි, 115 පිට.

77 **ශ්‍රී ලංකා මූර්ති**, (සංස්.), නන්දන චුට්වොනස් වෙනත් අය, 86 පිට.

78 **එම.**,

පාද පීඨයේම ඇති අධාරකයක් මත පතුල තබා තිබේ. යටිකය ධෝතියකින් ආවරණය වී තිබෙන අතර එය බඳ පටියෙන් රදවා තිබේ. නිර්වස්ත්‍ර උඩුකය ඍජු අතර සහ ස්ථූල ය. විශාල නොවූ මෙම ප්‍රතිමාව සුසංගත සමතල අනුව යන හැඩයෙන් යුත් පිරුණු සිරුර මෘදු බවක් දක්වයි. මෙරටට ආවේණික නොවූ සෞන්දර්ය චින්තනයක සලකුණු පෙනුණත් ශ්‍රී ලාංකේය මූර්ති කලාවට ආවේණික වූ තැන්පත් නොසැළෙනසුලු බව පිළිබඳ හැඟීමක් යටින් දිවෙයි.

වැලිගම කුෂ්ටරාජ පිළිමය අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ සිංහනාද අවතාරය පිළිඹිබු කරන නිර්මාණයක් ලෙස විශ්වාස කළ හැකි ය. මෙම මූර්තිය ශෛලිය අනුව ක්‍රි. ව. 8-9 ශත වර්ෂවලට අයත් නිර්මාණයක් ලෙස සලකනු ලැබේ.[79] කුෂ්ටරාජායැ'යි නම් කරනුයේ ජනප්‍රවාදයන්ට අනුවය.[80] වංසකතාවල හෝ වෙනත් ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් නොවන මෙය පිළිබඳව මෙතෙක් කාලනිර්ණයක් කර නොමැත.

මෙම දර්ශනීය බෝධිසත්ත්ව ප්‍රතිමාව දකුණු පළාතේ අග්‍රබෝධි විහාරය ඉදිරිපිට පිහිටා ඇති අතර ග්‍රැනයිට් පාෂාණයෙන් නිර්මාණය කර තිබේ. මෙම ප්‍රතිමාව හා බැඳුණ ජනප්‍රවාද රැසක් මෙම ප්‍රදේශයේ ඇත. අඩි තුනක් පමණ පළල ඉලිප්සාකාර ගල් කුහරයක පූර්ණ උන්නතිය සේ නෙළන ලද අඩි 12ක් පමණ උසැති සමභංග ඉරියව්ව සහිත ප්‍රතිමාවකි. දෙපා එකිනෙකට සමාන්තර ව පිහිටා තිබේ. රාජ ඇඳුමින් සැරසුණ මෙහි ඉණ ධෝතියකින් සැරසී ඇත.[81] පටි තුනකින් සමන්විත අලංකාර වළලු සහිත බඳ පටියකින් සරසා ඇත. ඇඳුම් රහිත ශරීරයේ උඩ කොටස හාර, වෛකක්ෂක, උදරබද්ධ වැනි ආභරණවලින් සමන්විත ය. පපුව පුළුල් ලෙස දක්වා ඇති අතර ඉඟ සිහින් ය. දකුණතින් විතර්ක මුද්‍රාව නිරූපණය වේ. මුහුණ සතරැස් ස්වරූපයක් ගනී. නිකට සහ දෙතොල් සිහින් බව දැක්වීමට ශිල්පියා සමත්ව තිබේ. නාසය සහ දෑස් දිගටි ය. මෙහි ඉතාමත් වැදගත් අංගය වන්නේ හිස මත ඇති ඔටුන්න වැනි ශීර්ෂ ආභරණය යි. ඉතා විසිතුරු කැටයමින් ගැවසීගත් කිරීට මකුටය ඉදිරිපසින් ඇති කොටසින් නළල් පටයේ අඩුව සම්පූර්ණ වෙයි. මෙහි ධ්‍යානි බුද්ධ ප්‍රතිමා සතරක් ඇත. මෙම ලක්ෂණ සහිත ලංකාවෙන් සොයාගන්නා ලද එක ම නිර්මාණය මෙයයි. තවද ආරෝහපරිනාහ සම්පන්න ප්‍රතිමාවෙන් බලධාරිත්වය හා කරුණාව වැනි ගුණයන් පිළිබිඹුව වන බව කිව හැකි ය. වැලිගම ප්‍රතිමාව රජ කෙනෙකුගේ විලාසය පෙන්වන්නකි. නමුත් ජටාමකුටයේ අමිතාභ ධ්‍යානි බුදුන්ගේ බුදු රූ හතරක් දක්නට ඇති නිසා රජ රුවක් ලෙස සැලකිය හැකි නොවේ. එබැවින් සෙනරත් පරණවිතානගේ අදහස වන්නේ මෙය අවලෝකිතේශ්වර ප්‍රතිමාවක් බවයි.[82] මහාචාර්ය ප්‍රේමතිලක අදහස වන්නේ මෙම ප්‍රතිමාව සමන්තභද්‍ර ධ්‍යානි බෝධිසත්ත්ගේ සම්භෝගකාය නිරූපනය කරන බවයි.[83] මේ අනුව පැහැදිලි වන්නේ වැලිගම ප්‍රතිමා පිළිබඳව විද්වතුන් අතර විවිධ අදහස් පවතින බවයි.

පොළොන්නරුව කෞතුකාගාරයේ ද අවලෝකිතේශ්වර ප්‍රතිමා තුනක් දක්නට ලැබේ. මෙම ප්‍රතිමා පොළොන්නරුව, හිඟුරක්ගොඩ සහ කවුඩුල්ල යන ස්ථානවලින් සොයාගන්නා ලදී. 12 වන සියවසට අයත් බව හැගෙන ඒවා නිමවා ඇති ලෝහය වන්නේ ලෝකඩ ය. ස්ථාන තුනකින් සොයාගත්ත ද එකම ආකාරයේ ප්‍රතිමා විද්‍යාත්මක ලක්ෂණ දක්නට ඇත. ආයත චතුරශ්‍රාකාර සිහසුනක් මත, නමාගත් දකුණු පාදය ඒ මත තබාගෙන ද වම් පාදය එල්ලා වැටෙන ලෙස පිහිටා ඇත. තවද හිස මදක් පසුපසට නැමුණ බවක් දැක්වෙන අතර දෑස් පහතට යොමුවීම නිසා මහේශාක්‍ය බවක් පෙනේ. යෝගී බව නිරූපණය වන බැවින් ඇඳුම් ද චාම් ය. ප්‍රතිමාවල ජටා මකුටයේ බුද්ධ රූප හෝ ස්තූප සලකුණු ඇතත් හඳුනාගත නොහැකි ය. සිරුර හා අත් පා සියුම් ලෙස නිමවා ඇත. මෙම ප්‍රතිමා දෙස බැලීමේදී පෙනීයන්නේ අනුරාධපුර යුගයේදී විකාශනය වූ රූපවල බොහෝ කරුණු පොළොන්නරු යුගයේ ප්‍රතිමා නිර්මාණයේදී පවත්වාගෙන ගිය බවයි. තෙල්වත්ත රජමහා විහාරයේ ද අවලෝකිතේශ්වර ප්‍රතිමාවක් ඇත. අවලෝකිතේශ්වර නාථ වශයෙන් හඳුනා ගැනීමෙන් පසු ඉදිවූවකි.[84]

---

79 P.L. Premathilaka, **"The Kustaraja Image at Valigma"**, **Senrat Paranavitana Commemoration Volume**, (Colombo: 1978), 279pp.

80 ආර්.එච්. උදේපොළ, **වැලිගම කුෂ්ටරාජගල බෝධිසත්ව ප්‍රතිමාව**, (රුහුණේ සංස්කෘතික මධ්‍යස්ථානය, 1994), 01 පිට.

81 ලගමුව, 1997, 106 පිට.

82 පරණවිතාන, 1962, 181 පිට.

83 P.L. Premathilaka "The Kustraja Image at Valigma", **Senrat Paranavitana Commemoration Volume**, 279p.

84 මංගල ඉලංගසිංහ, **මධ්‍යකාලීන ලංකාවේ ආගම**, (කොළඹ: එස්. ගොඩගේ සහ සමාගම, 2005), 270-273 පිටු.

මධ්‍යතන යුගයේ පසු කාලයේ සිට ප්‍රසිද්ධ අධ්‍යාපනික හා සංස්කෘතික මධ්‍යස්ථානයක් වූ තොටගමුව 15වන සියවසේ පමණ සිට අවලෝකිතේශ්වර නාථ වන්දනයේ ප්‍රකට ස්ථානයකි.[85] මයුරා හැරුණු විට මුහුදුබඩ මඟෙහි ආ ගිය සෑම දූතයාම තොටගමුවේ නාථ දෙවිඳුන් අමතක කොට නැත.[86] මෙහි ඇති ප්‍රතිමාව 18වන සියවසට පෙර ඉදි කරන ලද්දකි. විසිතුරු ආභරණයෙන් සැරසී සිටින මෙම ප්‍රතිමාව දකුණතින් අභය මුද්‍රාවත් වමතින් වරද මුද්‍රාවත් නිරූපණය කරයි. මෙම ප්‍රතිමාව දෙපස සෙමර දරා සිටින දිව්‍ය සේනා හා දෙපසින් පනින විලාසයෙන් සිටින, රාජකීයත්වය සංකේතවත් වන සිංහයන් දෙදෙනා උත්තරීත්වය විදහා පායි.

## සමෝධානය

මේ ආකාරයෙන් බැලිමේදී ඉන්දියානු ආභාසය මත ගොඩනැගෙන බෝධිසත්ත්ව වන්දනය ලාංකික ජන සමාජය තුළ ද ස්ථාපිත වී කෙන්ද්‍රගත විය. එතැන් සිට රාජ අනුග්‍රහය මගින් බෝධිසත්ත්ව වන්දනයට ද විශාල වටිනාකමක් ලැබේ. මහායානයේ බෝධිසත්ත්වයන් අතර අවලෝකිතේශ්වර බෝධිසතුන්ට විශේෂ වැදගත්කමක් හිමි වේ. හත්වැනි සහ අටවැනි සියවස්වල දිවයිනේ ආගමික සංස්කෘතිය මගින් අවලෝකිතේශ්වර පිළිගන්නා අවස්ථාවේ පටන් නාථ දෙවියන් මෑත යුගයේදී නාථ දෙවියන් මෛත්‍රෙය ලෙස පිළිගන්නා ලද අවස්ථාව දක්වා අතරතුර මේ බෝධිසත්ත්වයන් හා දෙවියන්ගේ නිර්මිත ප්‍රතිමා මනුෂ්‍යරූපී සංකේත පද්ධතියක් ඔස්සේ විකාශනය විය. එම ප්‍රතිමා නිර්මාණයේදී මෙරට ශිල්පියාගේ කුසලතාවය මනා ලෙස හුවා දැක්වීමට ද සමත් වී ඇත.

85 **ගිරා සංදේශය**, (සංස්.), මකුළුදුවේ පියරතන, (කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, 1948), කවි. 11.

86 සිරි තිලකසිරි, **සිංහල සංදේශ කාව්‍යයේ සමාජ පසුබිම**, (කොළඹ: එස්. ගොඩගේ සහ සමාගම, 2008), 170 පිට.